**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
sjturaus@optusnet.com.au

**Account Name - Sannasa Media**
Bank - Cmmonwealth
SBS - 063619
Ac - 10852409

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

**වැදගත්**

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත



# ඉදිරි මැතිවරණය සහ ලංකාව

**තලාව, ඥානෝදය පිරිවනේ දී එක්සත් ජාතික පක්ෂ ක්‍රියාකාරීන් හමුවීමෙන් අනතුරුව එක්සත් ජාතික පක්ෂ නායක සහ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා කළ කතාව**

අද අපි අනුරාධපුරයේ සියලූම පාක්ෂිකයින් හමු වෙනවා. ඔවුන් සමග අදහස් හුවමාරු කර ගන්නවා. ආණ්ඩු බලය ලබාගෙන වසර 02ක් ගත වූ පසු පාක්ෂිකයන් ලෙස අපට කළ සහ නොකළ වැඩකටයුතු තිබෙනවා. ඇතැම් වැඩ කටයුතු ඉටු කිරීමට කල් ගත වූ නිසා අපේ පාක්ෂිකයින් සුළු පිරිසක් කනස්සල්ලට පත්වී සිටිනවා. ඒ පිළිබඳවත් අවධානය යොමු කරමින් නොකෙරුණු වැඩකටයුතු ඉටු කරමින් අපට ඉදිරියට යාමට සිදුව තිබෙනවා.

විශේෂයෙන්ම අප එක් කාරණයක් සිහි තබා ගත යුතුයි. අද අපේ රටේ පවතින පාලන ව්‍යුහය අනුව බලය කොටස් 03 කට බෙදී තිබෙනවා. පළමු කොටස බිම් මට්ටමේ තිබෙන ප්‍රාදේශීය සභා සහ නගර සභා යි. විවිධ කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඔවුන්ට සීමා සහිත බලයක් තිබෙනවා. බොහෝවිට මහ ආණ්ඩුව සමග ඔවුන්ගේ තිබෙන්නේ අඩු සම්බන්ධතාවයක්. දෙවන කොටස නම් පළාත් සභා ආයතනයි. 13 වන සංශෝධනය හරහා අපේ ආණ්ඩුව පළාත් සභාවලට නිසි බලයක් මේ වන විට ලබා දී තිබෙනවා.

තුන්වන කොටස මෙන්ම එහි ඉහළම කොටස ලෙස කටයුතු කරන්නේ ආණ්ඩුවයි. ජාතික ආණ්ඩුවේ ප්‍රධාන කොටස්කරුවා ලෙස අපි එහිදී ක්‍රියා කරනවා. බිම් මට්ටමත්, මධ්‍යස්ත කොටස වන පළාත් සභාත්, මහ ආණ්ඩුව සමග ඇති සම්බන්ධතාවයේ අඩුවක් ඇති බැවින් ඇතැම් වැඩකටයුතු අපට සිදු කිරීමට නොහැකි වී තිබෙනවා.

**එළඹෙන මැතිවරණය පැවැත්වෙන්නේ මනාප ක්‍රමයට නොවෙයි**

බිම් මට්ටමේ ප්‍රාදේශීය සභා, නගර සභා ආදියේත්, පළාත් සභා ආයතනවලත් බලය එක්සත් ජාතික පක්ෂයට ලබාගැනීමට දැන් අවස්ථාව ලැබී තිබෙනවා. බිම් මට්ටමේ බලය ලබාගත් පසු නගර සභා, ප්‍රාදේශීය සභා වෙනුවෙන් ආධාර උපකාර කිරීම් තවත් වැඩි කිරීමට අපට හැකියාව ලැබෙනවා. එම නිසා අප එළඹෙන මැතිවරණයට හොඳින් සූදානම් විය යුතුයි.

එළඹෙන මැතිවරණය පැවැත්වෙන්නේ මනාප ක්‍රමයට නොවෙයි. මෙහිදී පුංචි ඡන්ද කොට්ඨාශ 5000 ක් පමණ වෙනුවෙන් පැවැත්විය යුතුයි. ජනාධිපති වරණය පවත්වන්නේ එකවර සමස්ත රට වෙනුවෙනුයි. පාර්ලිමේන්තු සහ පළාත් සභා මැතිවරණ රටේ මැතිවරණ කොට්ටාශ 22ක පවත්වනවා. ඒ වගේම ප්‍රාදේශීය සභා, නගර සභා මැතිවරණ සමස්ත දිවයින පුරාම කොට්ඨාශ 5000 ක් පමණ වෙනුවෙන් පැවැත්විය යුතු වෙනවා. වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබා ගැනීමට හැකි අපේක්ෂකයෙක් අපි ඒ මැතිවරණයට ඉදිරිපත් කළ යුතුයි. ඇතැම් අපේක්ෂකයන්ට මැතිවරණය ජයග්‍රහණය කළ නොහැකි බව පක්ෂය හෝ ප්‍රදේශයේ සංවිධායක විසින් පැවසුවොත් ඒ වෙනුවෙන් වෙනත් අයෙකු නම් කිරීමට අපට සිදු වෙනවා. ඒ වගේම මැතිවරණය සඳහා දුර්වල අපේක්ෂකයින් ව වැඩි වශයෙන් ඉදිරිපත් කළහොත් ඉදිරියේදී එම සංවිධායකටත් මැතිවරණ සඳහා තරග කිරීමට අවස්ථාවක් ලබා දෙන්නේ නැහැ.

ඉදිරියේදී පැවැත්වෙන පළාත් සභා මැතිවරණයත් කොට්ඨාශ ක්‍රමයට පැවැත්වීමට අප තීරණය කර තිබෙනවා. අපට අවශ්‍ය තරග කර පරාජයට පත්වීමට නොවෙයි අපට අවශ්‍ය ජයග්‍රහණයයි. බිම් මට්ටම ශක්තිමත් කිරීම ජයග්‍රහණය කිරීමේ අරමුණයි. එය ඉතා වැදගත් වනවා. එවිට මැද කොටස වන පළාත් සභා වෙතද අවධානය යොමු කළ හැකියි. ඒ වෙනුවෙන් අප සියලූ දෙනාම වෙහෙස වී වැඩ කළ යුතුයි.

ප්‍රාදේශීය සභා මැතිවරණවලට ඉදිරිපත් වන නියෝජිතයින්ට යම් වාසියක් හිමි වෙනවා. එනම් මැතිවරණය වෙනුවෙන් විශාල ලෙස මුදල් අවශ්‍ය නොවීමයි. මෙම මැතිවරණවලදී ජයග්‍රහණය සඳහා

8 වන පිටට




